සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | පුරවැසි අධ්‍යාපනය | 1 | 2. කාලීන වෙනස්වීම් |


සැකසුම- එච්.කේ.වී.මංගලා

බප/හො/ඉළිඹ ගාමිණී විද්‍යාලය














# ➢ හැඳින්වීම

- තාක්ෂණය
- නව තාක්ෂණික මෙවලම්
- තාක්ෂණය ජන ජීවිතයට යහපත්ව හා අයහපත්ව බලපාන ආකාරය
- යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමේ වැදගත්කම
- ආර්ථිකයේ සිදු වන කාලීන වෙනස්කම්
- එම වෙනස්වීම්වලට අනුගතව කටයුතු කිරීම
- රැකියා වෙළඳපොළ හා එහි ප්‍රවණතා
- නව රැකියා සඳහා සපුරාලිය යුතු සුදුසුකම්
- තරගකාරී ලෝකය සමඟ කටයුතු කිරීමේ දී සහජීවනයෙන් යුතු යහජීවනයක අවශ්‍යතාව.
- සමුපකාර ව්‍යාපාරය, එහි කාර්යභාරය හා එමඟින් සැලසෙන සේවා
- කාලීන සමාජ වෙනස්වීම්වලට අනුගතව දේශීයත්වය රැක ගනිමින් විශ්ව ගම්මානයේ සාමාජිකයකු ලෙස කටයුතු කිරීම පිළිබඳව නිපුණතා සංවර්ධනය කරගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

# 2.1 තාක්ෂණයේ වෙනස්වීම් හා ඒවාට දක්වන ප්‍රතිචාර

## 2.1.1 තාක්ෂණය හැඳින්වීම

- තාක්ෂණය යනු

**තම කටයුතු වඩා පහසු කර ගැනීම සඳහා මිනිසා යොද ගන්නා ක්‍රම වේදය යි**

## 2.1.2 තාක්ෂණික වෙනස්වීම්


- තාක්ෂණික වෙනස්වීම යනු

මිනිස් අවශ්‍යතා පහසු කර ගැනීම සඳහා යොදා ගනු ලබන ක්‍රමවේදවල වෙනස්කම් ය.

- තාක්ෂණික වෙනස්වීමේ ආරම්භය

වැඩවසම් ක්‍රමය බිඳ වැටීම,
මිනිසා පොත පත පරිශීලනයට යොමු වීම,
මිනිසාගේ චින්තන ශක්තිය දියුණු වීම,
විද්‍යාව හා තාක්ෂණය ද ක්‍රමයෙන් දියුණු වීම,
නව සොයාගැනීම් රැසක් ලෝකයට දායාද වීම.

- තාක්ෂණික වෙනසට නිදසුනක්



## 2.1.3 ගවේෂණ හා පර්යේෂණ මගින් කෙරෙන නව සොයා ගැනීම්


- පර්යේෂණයක් යනු
  - විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් ගැටලුවක් පිළිබඳ විසඳුම් සොයා ගැනීමට කෙරෙන අධ්‍යයනයකි.
- ගවේෂණ හා පරියේෂණ සිදු කිරීමේ වැදගත්කම
  - වැඩි දියුණු කරන ලද තාක්ෂණික නිෂ්පාදන බිහි කිරීමට හැකි වීම.
- අතීතයෙන් නිදසුනක්
  - පුනරුද සමයේ සිදු වූ වෙනස

    පොත පත කියවීමට යොමු වීම,

    චින්තන ශක්තිය දියුණු වීම,

    ගවේෂණ හා පර්යේෂණ වලට යොමු වීම,

    නව සොයා ගැනීම් රැසක් බිහි වීම. (කාර්මික විප්ලවය ඇතිවීම )



## 2.1.4 තාක්ෂණය වෙනස්වීම සමග ඇති වන සමාජ වෙනස්වීම්

- තාක්ෂණයේ වෙනස්වීම → සමාජයේ සිදු වූ වෙනස්කම්
  - මිනිසාගේ පරිභෝජන රටාව වෙනස් වීම
  - නව රැකියා රැසක් බිහි වීම
  - ආහාර පානවල නිෂ්පාදනය හා භාවිතය වෙනස් වීම
  - තාක්ෂණික වෙනස්වීම් නිසා ඇතිවන හිතකර හා අහිතකර බලපෑම්

❖ අහිතකර බලපෑම්

- මිනිසා අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම
- මිනිසුන් යාන්ත්‍රිකරණය වීම
- සමාජය සංකීර්ණ වීම
- පරිසර දූෂණය වේගවත් වීම

❖ හිතකර බලපෑම්

- වැඩ පහසු වීම
- කාලය ඉතිරි වීම
- සම්පත් නාස්තිය අවම වීම
- ඵලදායීතාව වැඩි වීම
- කාර්යක්ෂමතාව වැඩි වීම
- මානව හා සමාජ සම්බන්ධතා පුළුල් වීම

## 2.1.5 නිර්මාණශීලී පුරවැසියෙකු වශයෙන් තාක්ෂණික වෙනස්වීම් යොදා ගැනීමේ වැදගත්කම

❖ මෙම කියමන පිළිබඳ මදක් සිතන්න

> "අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී"
>
> කුමාරතුංග මුනිදාස

❖ වර්තමානයේ තාක්ෂණය යොදා ගැනෙන අවස්ථා

- විවිධ ගෘහ අවශ්‍යතා සඳහා
- විවිධ සේවා අවශ්‍යතා සඳහා (අධ්‍යාපනය, ප්‍රවාහනය, සන්නිවේදනය, සෞඛ්‍යාරක්ෂණය)
- විවේකය හා විනෝද කටයුතු සඳහා
- සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා
- නව නිපැයුම් බිහි කිරීම සඳහා
- නිෂ්පාදන කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීම සඳහා

## 2.1.6 යෝග්‍ය තාක්ෂණය

- යෝග්‍ය තාක්ෂණය යනු
  රටක පවත්නා සමාජ,ආර්ථික,සංස්කෘතික,පාරිසරික රටාවලට
  ගැළපෙන පරිදි තාක්ෂණය යොදා ගැනීම
- නිදසුනක් -
  ශ්‍රම සම්පත් බහුල රටක නිෂ්පාදන ක්‍රියාවලියේදී,
  ශ්‍රම සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි ආකාරයට තාක්ෂණය
  භාවිත කිරීම.
- තාක්ෂණය භාවිතයේදී අවධානය යොමු කළ යුතු කරුණු
  සාම්ප්‍රදායික කර්මාන්ත සුරකිමින් කාර්මීකරණය වෙත යාම
  රටට ඔරොත්තු දෙන අයුරින් කර්මාන්ත අංශය පුළුල් කිරීම

## 2.1.7 තිරසාර සංවර්ධනය ඇති කර ගැනීමට යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අත්වන ප්‍රතිලාභ

- තිරසාර සංවර්ධනය යනු

  අනාගත පරපුරේ අවශ්‍යතා සඳහා අවශ්‍ය වන සම්පත් නැති නොකර,

  වර්තමාන කටයුතු සඳහා සම්පත් යොදාගෙන

  පරිසරයට හානියක් නොකරමින් සිදු කරන සංවර්ධනය යි.

- සංවර්ධනය සඳහා යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අත්වන ප්‍රතිලාභ

  - සම්පත් අපතේ යාම වැළකීම
  - ශ්‍රම සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වීම
  - පරිසර හානිය අවම වීම
  - පාරිසරික තුල්‍යතාව රැක ගත හැකි වීම
  - රටේ ආර්ථිකයට දරාගත හැකි වීම


## 2.2 ආර්ථිකයේ සිදු වන වෙනස්වීම්වලට අනුගත වීම

### 2.2.1 තාක්ෂණ සමග ආර්ථිකයේ සිදු වන වෙනස්කම්

- මිනිස් අවශ්‍යතා - අසීමිතය,සංකීර්ණය
- ස්වභාවික සම්පත් - ඉතා සීමිතය
- මිනිස් අවශ්‍යතා ඉටු කර ගන්නේ -සීමිත වූ සම්පත් යොදා ගෙන අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරයි
- ආර්ථිකයක සිදු වන ප්‍රධාන ක්‍රියාවලි තුන
    - නිෂ්පාදනය
    - බෙදාහැරීම
    - පරිභෝජනය

- නිෂ්පාදනය - මිනිස් ශ්‍රමය හා ශිල්ප ක්‍රම යොදා ගනිමින් ,පවත්නා සම්පත් මිනිස් අවශ්‍යතාවලට සරිලන පරිදි භාණ්ඩ බවට පත් කිරීමේ ක්‍රියාවලිය
- බෙදාහැරීම - නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා දක්වා ලබා දීමේ ක්‍රියාවලිය
- පරිභෝජනය - නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවා යොදා ගෙන මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කරගැනීම

❖ ආර්ථිකයක වෙනස්වීම් සිදුවන ප්‍රධාන අංශ



## 2.2.1.1 කෘෂිකාර්මික අංශය තුළ සිදු වන කාලීන වෙන

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තයයි
  
  වී වගාව , හේන් වගාව , එළවළු හා පලතුරු වගාව
- බටහිර ජාතීන්ගේ ආගමනයත් සමග වාණිජ භෝග වගාව ආරම්භ කිරීම
  
  තේ , පොල් , රබර් වගාව
- තාක්ෂණයේ ඇති වූ ශීඝ්‍ර දියුණුව කෘෂි අංශය තුළ සිදු කළ වෙනස
  - යන්ත්‍ර සූත්‍ර භාවිතය
  - රසායනික පොහොර හා පළිබෝධනාශක භාවිතය
  - නව ජල සම්පාදන ක්‍රම යොදා ගැනීම
  - නව වගා ක්‍රම හා හරිතාගාර වගා ක්‍රම භාවිතය
  - නිෂ්පාදන විවිධාංගීකරණය


බිම් සැකසීම


පැළ සිටුවීම


අස්වනු නෙළීම

රසායනික පොහොර හා පළිබෝධනාශක භාවිතය


රසායනික පොහොර යෙදීම


පළිබෝධනාශක යෙදීම

## 2.2.1.2 කාර්මික අංශයයේ සිදු වන වෙනස්කම්

- ශ්‍රම විභජනය හා විශේෂිකරණය ඇති වීම
- එකලස් කිරීමේ කර්මාන්ත බිහි වීම
- අධිතාක්ෂණික කර්මාන්ත බිහි වීම
- නිෂ්පාදන ක්‍රියාවලියට රොබෝ තාක්ෂණය යොදා ගැනීම



වාහන එකලස් කිරීමේ කර්මාන්තයක අංශ කිහිපයක්

## 2.1.2.3 සේවා අංශයේ සිදු වන වෙනස්කම්

❖ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර හා ඒවායේ සිදු වී ඇති වෙනස්කම්

අධ්‍යාපන



ගල් ලෑල්ල



උඩිස් ප්‍රක්ෂේපණ යන්ත්‍රය (OHP)



බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය

සෞඛ්‍ය





බැංකු






ප්‍රවාහන



මගී නෞකාවක්



ගුවන් යානයක්



නවීන බස් රථයක්



අධිවේගී දුම්රියක්

## ❖ නවීන තාක්ෂණය සමග සන්නිවේදනයේ ඇති වූ වෙනස

- ගිනිමැල දැල්වීම
- පක්ෂීන් යොදා පණිවිඩ යැවීම
- ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් දූරකථනය සොයා ගැනීම
- රැහැන් සහිත දූරකථනය භාවිතය
- ෆැක්ස් යන්ත්‍රය
- නවීන ජංගම දූරකථනය
- චන්ද්‍රිකා භාවිතය


ගිනිමැල දැල්වීම


පක්ෂීන් යොදා පණිවිඩ යැවීම


ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්ගේ දූරකථනය


දූරකථනය


ෆැක්ස් යන්ත්‍රය


නවීන ජංගම දූරකථනය


චන්ද්‍රිකා භාවිතය

## 2.2.2 ආර්ථිකයේ සිදු වන විවිධ වෙනස්වීම් පුද්ගලයා හා සමාජය කෙරෙහි ඇති කරන බලපෑම

- මිනිසාගේම මැදිහත් වීමෙන් ආර්ථිකයේ වෙනස්වීම් බොහෝමයක් සිදු කර ඇත.

**නමුත්**

එම වෙනසම පුද්ගලයා හා සමාජය කෙරෙහි විවිධ බලපෑම් කර ඇත.





- පරිසරය දූෂණය වීම
- යාන්ත්‍රිකරණය වීම
- පුද්ගලයා අයහපත් පරිභෝජන රටාවකට හුරු වීම
- ආර්ථිකයට ඔරොත්තු නොදෙන ජීවන රටාවකට යොමු වීම

- කාලීන වෙනස් වීම් උචිත පරිදි භාවිතයට ගැනීමට අපි සවිඥානික වෙමු.

- තම අවශ්‍යතා හඳුනා ගෙන ඊට යෝග්‍ය තාක්ෂණය භාවිත කිරීම
- තාක්ෂණයට දැඩි ලෙස වහල් නොවීම









## 2.3 රැකියා වෙළෙඳපොළ හා බැඳුණු නව ප්‍රවණතා

❖ 2.3.1 රැකියා වෙළෙඳපොළ හා බැඳුණු නව ප්‍රවණතා හඳුනා ගනිමු

- වැඩ ලෝකය යනු - සමාජයේ පවත්නා සියලු ම රැකියා අවස්ථා
- රැකියා වෙළඳපොළ - ලෝකයේ රැකියා අවස්ථා සඳහා පවත්නා වූ ඉල්ලුම හා සැපයුම
- රැකියා වෙළඳපොළෙහි ව්‍යාප්තව ඇති විවිධ ක්ෂේත්‍රවල රැකියා අවස්ථා

| කෘෂි කාර්මික අංශය | කාර්මික අංශය | සේවා අංශය |
|---|---|---|
| කාබනික පොහොර නිෂ්පාදකයින්<br>කෘෂි තාක්ෂණ ශිල්පීන් | රොබෝ තාක්ෂණ ශිල්පීන්<br>නැනෝ තාක්ෂණ ශිල්පීන් | නීති උපදෙස් සපයන්නන්<br>ගෘහ අලංකරණ ශිල්පීන් |

- කාලීන වෙනස්වීම් සමග රැකියා වෙළෙඳපොළෙහි රැකියා සඳහා පවතින ඉල්ලුම වෙනස් වීමට බලපා ඇති කරුණු

  මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම

  අධ්‍යාපනය ලබන පිරිස ක්‍රමිකව වැඩි වීම

## 2.3.2 නව ප්‍රවණතා ඔස්සේ විවෘත වන රැකියා







- පරිගණක දත්ත සැකසුම් ශිල්පීන්
- මෘදුකාංග ශිල්පීන්
- ජාන තාක්ෂණ ශිල්පීන්
- ග්‍රැෆික් නිර්මාණකරුවන්
- මාධ්‍ය ශිල්පීන්
- උත්සව සංවිධානකරුවන්
- දත්ත විශ්ලේෂකයන්

❖ රැකියා වෙළෙඳපොළෙහි පවතින නව ප්‍රවණතාවලට සරිලන අයුරින් තම සුදුසුකම් සපුරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු

- නව තාක්ෂණික උපකරණ පිළිබඳ පුහුණුව
- පරිගණක භාවිතය පිළිබඳ දැනුම
- විවිධ භාෂාමය හැකියා වර්ධනය කර ගැනීම







## 2.4 තරඟකාරී ලෝකය තුළ යහජීවන ගුණාංග ප්‍රගුණ කරමින් සහජීවනයෙන් කටයුතු කිරීම

### 2.4.1 යහජීවනය

- යහජීවනය යනු - යහපත්ව ජීවත් වීම
  අන් අයට කරදරයක් නොවන අයුරින් නීත්‍යානුකූල මාර්ගවලින් ධනය උපයාගෙන ධාර්මිකව ජීවත් වීම

- මුනිදාස කුමාරතුංග මහතා විසින් රචිත <u>**ශික්ෂා මාර්ග**</u> පොතෙහි අන්තර්ගත <u>**සිරිමත්**</u> නැමති කවි පන්තියේ අන්තර්ගත යහජීවන ගුණාංග
  - උදයම අවධි වීම
  - කුල දෙවියන් නැමදීම
  - ගේ දොර පිරිසිදු කිරීම
  - වැඩිහිටි උපදෙස් ලබා ගැනීම..........







- දමිළ සාහිත්‍යයේ අන්තර්ගත යහජීවන ගුණාංග

அழுக்காறு அவாவெகுளி இன்னாச் சொல் நான்கும்
இழுக்கா இயன்ற அறம்.

அதிகாரம் - 4 குறள் - 35

"ඊර්ෂ්‍යාව, ආශාව, කෝපය, නරක වචන
කථා කිරීම ආදියෙන් ඉවත් වීම යහපත් ධර්මයයි."



## 2.4.2 යහජීවනයක අවශ්‍යතාව

- සමාජ ප්‍රගමනය සඳහා යහජීවනයක අවශ්‍යතාව වැඩි වීම කෙරෙහි බලපාන කරුණු
  - ධාර්මිකව ධනය ඉපැයීම හා පරිහරණය
  - සාධාරණත්වය
  - සාමය
  - සමාජ යහපැවැත්ම සඳහා



## 2.4.3 යහජීවන ගුණාංග

- යහජීවන ගුණාංග යනු මානව සමාජය යහපත්ව පවත්වාගෙන යාම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංගයන්ය.
  - නීතිගරුක බව
  - හොඳින් සවන් දීම
  - පරිත්‍යාගශීලී බව
  - ධාර්මික බව








## 2.4.4 යහජීවනයෙන් කටයුතු නොකිරීමෙන් ඇති වන ප්‍රතිවිපාක



- සමාජ සුරක්ෂිත බව බිඳ වැටීම
- යහපැවැත්ම  බිඳ වැටීම
- අපචාර වැඩි වීම
- ස්වභවික සම්පත් විනාශ වීම

## 2.4.5 යහජීවනය  සමාජයේ  යහපැවැත්මට බලපාන ආකාරය

- සමාජ සුරක්ෂිතතාව තහවුරු වීම
- ධර්මිෂ්ඨ නිවහල් සමාජයක් ගොඩනැගීම
- අල්ලස්, දූෂණ, වංචාව, හොරකම ඇතුළු විවිධ විෂමාචාර ක්‍රියා පිටු දැකිය හැකි වීම

## 2.4.6 සහජීවනය

- එකට ජීවත් වෙමින් එකිනෙකාට උදවු කර ගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීම සහජීවනය යි.

"Coexistence is a state in which two or more groups are living together while respecting their differences and resolving their conflicts nonviolently"

**By - Angela Nyawira**

කණ්ඩායම් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ එකට ජීවත් වීමේ දී එකිනෙකාගේ වෙනස්කම්වලට ගරු කරමින්, ප්‍රචණ්ඩත්වයෙන් තොරව ප්‍රශ්න විසඳා ගෙන ජීවත් වීම සහජීවනයයි.

ඇන්ජලා නියවීරා

## 2.4.7සහජීවනයක අවශ්‍යතාව

- සහජීවනයෙන් කටයුතු කරන අවස්ථා

ආගමික උත්සව සැමරීමට
සිංහල,දෙමළ,මුස්ලිම
තරුණ එකමුතුවක්....

ගෙයි වහළ සෙවිලි
කිරීමට අසල්වැසියෝ
සහය වූහ

- වර්තමාන සමාජයේ සහජීවනයක අවශ්‍යතාවට නිදසුන්
  - සමාජ සුරක්ෂිත බව තහවුරු කිරීමට
  - තම අවශ්‍යතා ඉටු කරගත නොහැකි අයට උපකාර කිරීමට

## 2.4.8 සහජීවන ගුණාංග

- සහයෝගයෙන් කටයුතු කිරීම
- බෙදාහදා ගැනීම
- අන්‍යයන්ට ගරු කිරීම
- සුහද බව












## 2.4.9 සහජීවන ගුණාංග ජීවිතයට අදාළ කරගැනීමේ වැදගත්කම

- මිනිසාට තනිව ජීවත් විය නොහැක..........පවුල,ප්‍රජාව,සමාජය සමග කටයුතු කිරීමට සිදු වේ.
- මෙසේ අන්‍යයන් සමග කටයුතු කිරීමේ දී සහජීවන ගුණාංග ජීවිතයට අදාළ කරගැනීමේ වැදගත්කම,
  - සාමය ස්ථාපිත වේ
  - ගැටුම් අවම වේ
  - සමාජ සංවර්ධනය වේගවත් වේ
  - සමාජ සුරක්ෂිතතාව තහවුරු වේ
  - අන්‍යෝන්‍ය සුහදතාව ගොඩනැගීම









## 2.4.10 සහජීවනය සහ යහජීවනය පුද්ගල හා සමාජ සංවර්ධනයට වැදගත් වන ආකාරය

- මෙම යහ ගුණාංග විවිධ පුද්ගලයන් තුළ අඩු වැඩි වශයෙන් දක්නට ලැබේ
- එම ගුණාංග අනුව ජීවත් වන පුද්ගල කණ්ඩායම් කිහිපයක් හඳුනාගත හැකිය

1.සහජීවන ගුණාංග අඩු නමුත් යහජීවන ගුණාංග වැඩි පුද්ගලයෝ-සමාජ සංවර්ධනයට වන දායකත්වය අල්පය

2.සහජීවන ගුණාංග වැඩි නමුත්යහජීවන ගුණාංග අවම පුද්ගලයෝ -මෙවැනි අය සමාජයට කරදරයකි,

3.සහජීවන ගුණාංග මෙන් ම යහජීවන ගුණාංග ද අවම පුද්ගලයෝ-මොවුන්ගෙන් සමාජයට යහපතක් සිදු නොවේ

4.සහජීවන ගුණාංග හා යහජීවන ගුණාංග ද උපරිම පුද්ගලයෝ-

පුද්ගල හා සමාජ අභිවෘද්ධියට හේතු වේ.

# 2.5 සමූපකාර ව්‍යාපාරය ( Cooperative Movement )

## 2.5.1 සමූපකාර ව්‍යාපාරය හැඳින්වීම

- සමූපකාර ව්‍යාපාරය යනු - සාමූහිකව,සහයෝගයෙන් ,සමානාත්මතාවයෙන් යුතුව පොදු අවශ්‍යතා ඉටු කරගැනීමට හා සමාජ ශුභ සාධනය ඇති කර ගැනීම සඳහා සිය කැමැත්තෙන් ඇති කරගත් සංවිධානය.
- සමූපකාර ව්‍යාපාරයේ පියා - බ්‍රිතාන්‍ය ජාතික රොබට් ඕවන්
- සමූපකාර ව්‍යාපාරය පිළිබඳ නිර්වචනය -

> ආර්ථික දියුණුව සඳහා මිනිසුන් අතර පවතින තරගය වෙනුවට සහයෝගය හා සාරධර්ම ඇතුළත් හොඳ සමාජ පරිසරයක් පදනම් කර ගත් සේවය සමූපකාරය නම් වේ.
>
> බ්‍රිතාන්‍ය ජාතික රොබට් ඕවන් - 1845

- නූතන සමූපකාර ව්‍යාපාරය පිළිබඳ නිල නිර්වචනය

> "සමූපකාරය යනු ස්වේච්ඡාවෙන් ඒකාබද්ධ වූ පුද්ගලයන්ගේ ස්වයං පාලිත සංගමයක් ඔස්සේ ඔවුන්ගේ පොදු ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අවශ්‍යතා සහ අභිලාෂ ඉටු කරන සාමූහික අයිතිය හා ප්‍රජාතාන්ත්‍රික පාලනය ඇති ව්‍යවසායකත්වයකි."
>
> (International Co-operative Alliance - ICA - 1995)

- සමූපකාර ව්‍යාපාරයේ ආදර්ශ පාඨය

> එකා සැමටත් සැම එකාටත්

## 2.5.2 සමූපකාර ව්‍යාපාරයේ අරමුණු

- සාමාජික අවශ්‍යතා පිරිමසාලීම
- ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහාය වීම

## 2.5.3 සමූපකාර ව්‍යාපාරයේ වර්තමාන කාර්යභාරය



සමූපකාර ව්‍යාපාරයේ පියා රොබට් ඕවන්

- ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය මුලින්ම ආරම්භ වූයේ - ණය දෙන සමිති ලෙස
- මුල්ම සමූපකාර සමිතිය - දුම්බර සමූපකාර ණයදෙන සමිතිය ,ක්‍රි.ව.1906 තෙල්දෙණියේ දී ආරම්භ කරන ලදි
- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සමිති වර්ග -
  - විවිධ සේවා සමූපකාර සමිති
  - ජෛව සම්පත්සමූපකාර සමිති
  - රෝහල්සමූපකාර සමිති
  - පාසල් සමූපකාර සමිති

සමූපකාර ව්‍යාපාරයේ නිල ලාංඡනය

- ස

- පහසු මිලට පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි කිරීම
- ණය පහසුකම් සැපයීම
- විවිධ ශුභසාධන සේවා පවත්වාගෙන යාම
- බැංකු සේවා සැපයීම
- ප්‍රවාහන සේවා සැපයීම
- කෘෂි නිෂ්පාදන මිල දී ගැනීම
- රක්ෂණ සේවා සැපයීම
- රෝහල් පවත්වාගෙන යාම

## 2.5.4 විවිධ සේවා සමූපකාර සමිති හා පාසල් සමූපකාර සමිති

1. විවිධ සේවා සමූපකාර සමිති-
    - ණය දෙන සමිති වෙනුවට කාර්ය රැසක් ඉටු කරගත හැකි වන පරිදි පිහිටවූ සමූපකාර සමිතිය
    - මූලික පරමාර්ථය වෙනුයේ,සමූපාකාර ප්‍රතිපත්ති අනුව සාමාජිකයන්ගේ ආර්ථික ,සමාජීය හා සංස්කෘතික දියුණුව ඇති කිරීම
    - විවිධ සේවා සමූපකාර සමිති මගින්ඉටු වන සේවා
        - ණය දෙන සමිති පවත්වාගෙන යාම
        - අවමංගල්‍ය සේවා සැපයීම
        - ආරෝග්‍යශාලා සේවා පවත්වාගෙන යාම






2. පාසල් සමූපකාර සමිති

- පරමාර්ථය -සමූපකාර ක්‍රමය භාවිතයට යොමු කිරීම
  නිර්මාණශීලි නායකයන් බිහි කිරීම
- අරමුණ - සිසුන්ට අවශ්‍ය සියලු ලිපි ද්‍රව්‍ය පහසු මිලට සැපයීම
  ඵලදායී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා තරග පැවැත්වීම

## 2.5.5 පාසල් සමූපකාර සමිතියෙන් පාසල් දරුවන්ට ලබාගත හැකි සේවා

- නායකත්ව පුහුණුව
- සාමූහික ජීවන රටාවකට හුරු වීම
- ආහාර ද්‍රව්‍ය පහසු මිලට ලබා ගැනීම
- ක්‍රීඩා උපකරණ පහසු මිලට ලබා ගැනීම

## 2.6.2 දේශීයත්වය අර්ථාන්විතව අගය කිරීම

- දේශීය සංස්කෘතිය -ඒ ඒ රටවලට ආවේණික වූත් සුවිශේෂී වූත් සංස්කෘතිය යි
  - ශ්‍රී ලංකාවට ආවේණික සංස්කෘතිකාංග



- දේශීය නිෂ්පාදන - තම රටේ සම්පත් උපයෝගී කරගෙන රට තුළ කරන නිෂ්පාදන



- දේශයට ආවේණික දේ - තම රටට පමණක් ආවේණික වූ දෑ
  - දේශීය ඖෂධ , දේශීය ශාක , දේශීය සතුන්




කොතල හිඹුටු



කැකුණ



බදුල්ල



නීල කොබෙයියා



කළු වඳුරා



පතිරණ සාලයා

# දේශීය රාමුවෙන් ඔබ්බට ගොස් අන්‍ය සංස්කෘති හඳුනා ගැනීම හා ඒවායේ ඉගෙනීම

❖ ජපානයේ සංස්කෘතිකාංග






❖ අප්‍රිකානු සංස්කෘතිකාංග





❖ චීන සංස්කෘතිකාංග





## 2.6.3 සහජීවනය ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගැනීම

- පුද්ගලයෙකුට , ජනවර්ගයකට හෝ රටකට හුදෙකලාව ජීවත් වීම අපහසුය.

  එයට බලපා ඇති හේතු ,

  - සම්පත් විසංතුලනය
  - තම රටට අවශ්‍ය සියලු ම දෑ තම රට තුළ ම නිපදවාගත නොහැකි වීම
  - සමස්ත ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වීම








නොරොච්චෝලේ විදුලි බලාගාරය

## 2.6.4 අන්‍යෝන්‍ය රැඳියාව

- එකිනෙකාට උදවු කරගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීම අන්‍යෝන්‍ය රැඳියාවයි
- අන්‍යෝන්‍ය රැඳියාවෙන් කටයුතු කිරීම සඳහා පිහිටුවා ඇති සංවිධාන හා ගිවිසුම්
  - එක්සත් ජාතීන්ගේ සංවිධානය , සාර්ක් සංවිධානය
  - සප්තා ගිවිසුම , සප්ටා ගිවිසුම

**සවියෙන් පෙරට අපි එකට**

***e*- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **9** | **පුරවැසි අධ්‍යාපනය** | **1** | **2. කාලීන වෙනස්වීම් - ඇගයීම** |

**සැකසුම - එච්.කේ.වී.මංගලා**

**බප/හො/ඉළිඹ ගාමිණි කනිටු විදුහල**

(පෙළ පොත ඇසුරෙන් සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න)

1. තාක්ෂණය යන්න සරලව හඳුන්වන්න
2. තාක්ෂණය වෙනස්වීම සමග ඇති වන සමාජ වෙනස්වීම් තුනක් ලියන්න.
3. තාක්ෂණික වෙනස්වීම නිසා ඇති වන හිතකර බලපෑම් දෙකක් ලියන්න.
4. තාක්ෂණික වෙනස්වීම නිසා ඇති වන අහිතකර බලපෑම් දෙකක් ලියන්න.
5. යෝග්‍ය තාක්ෂණය යන්න සරලව හඳුන්වන්න.
6. යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අත් වන ප්‍රතිලාභ දෙකක ලියන්න.
7. තාක්ෂණික දියුණුවත් සමග කාර්මික අංශයේ සිදු වන වෙනස්කම් දෙකක් ලියන්න.
8. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුවට තාක්ෂණය බලපා ඇති ආකාරය සඳහා නිදසුන් දෙකක් ලියන්න.
9. ආර්ථිකයේ සිදු වන විවිධ වෙනස්වීම් පුද්ගලයා හා සමාජය කෙරෙහි ඇති කරන බලපෑම් දෙකක් ලියන්න.
10. තාක්ෂණික දියුණුවත් සමග රැකියා වෙළෙඳ පොළෙහි කාර්මික අංශයේ ඇති රැකියා දෙකක් ලියන්න.
11. රැකියා වෙළෙඳ පොළෙහි නව ප්‍රවණතාවල බලපෑම ඔස්සේ බිහි වී ඇති නව පන්නයේ රැකියා දෙකක් ලියන්න.
12. යහජීවනය යනු කුමක් ද?
13. සමාජ ප්‍රගමනය සඳහා යහජීවනයක අවශ්‍යතාව වැඩි වීම කෙරෙහි බලපාන කරුණු දෙකක් ලියන්න.
14. යහජීවන ගුණාංග දෙකක් ලියන්න.
15. දමිළ සාහිත්‍යයේ අන්තර්ගත යහජීවන ගුණාංගයක් ලියන්න.
16. යහජීවනයෙන් කටයුතු නොකිරීමෙන් ඇති වන ප්‍රතිවිපාක දෙකක් ලියන්න.
17. සහජීවනය යනු කුමක් ද?
18. වර්තමාන සමාජයේ සහජීවනයක අවශ්‍යතාවට නිදසුන් දෙකක් ලියන්න
19. සහජීවන ගුණාංග දෙකක් ලියන්න.
20. සහජීවන ගුණාංග ජීවිතයට අදාළ කර ගැනීමෙන් ඇතිවන ප්‍රතිලාභවලට නිදසුන් දෙකක් ලියන්න.
21. සමුපකාර ව්‍යාපාරයේ පියා කවුද ?
22. සමුපකාර ව්‍යාපාරය පිළිබඳ එතුමා කළ නිර්වචනය ලියන්න.
23. සමුපකාර ව්‍යාපාරයේ අරමුණු දෙකක් ලියන්න.

24. සමූපකාර ව්‍යාපාරයේ ආදර්ශ පාඨය ලියන්න.
25. සමූපකාර සේවාවෙන් ඉටු වන කාර්යයන් දෙකක් ලියන්න.
26. විවිධ සේවා සමූපකාර සමිති මගින් ඉටු වන සේවා දෙකක් ලියන්න.
27. පාසල් සමූපකාර සමිතියෙන් පාසල් දරුවන්ට ලබාගත හැකි සේවා දෙකක් ලියන්න.
28. ශ්‍රී ලංකාවට ආවේණික දේවල් වර්ග තුනක් යටතේ ලියන්න.(නිදසුන් දෙක බැගින්)
29. අන්‍යෝන්‍ය රැඳියාව යනු කුමක් ද?
30. අන්‍යෝන්‍ය රැඳියාවෙන් කටයුතු කිරීම සඳහා ලෝකයේ රටවල් පිහිටුවාගෙන ඇති සංවිධාන දෙකක් ලියන්න.

සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | පුරවැසි අධ්‍යාපනය | 1 | **2.** කාලීන වෙනස්වීම් - පිළිතුරු |

**සැකසුම - එච්.කේ.වී.මංගලා**

**බප/හො/ඉළිඹ ගාමිණී කනිටු විදුහල**

1. තම කටයුතු වඩා පහසු කර ගැනීම සඳහා මිනිසා යොදා ගන්නා ක්‍රමවේදය.

2.

- මිනිසාගේ පරිභෝජන රටාව වෙනස් වීම
- නව රැකියා රැසක් බිහි වීම
- නව විලාසිතා බිහි වීම
- නවීන වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ඇති වීම
- ආහාර පානවල නිෂ්පාදනය හා භාවිතය වෙනස් වීම
- විවේකය හා විනෝදය ගත කරන ආකාර වෙනස්වීම
- සමාජ සම්බන්ධතා දුර්වල වීම හා වේගවත් වීම
- පැරණි සාම්ප්‍රදායික ක්‍රම ශිල්ප අභාවයට යාම
- මිනිසාගේ සිතුම් පැතුම් වෙනස් වීම

3.

- වැඩ පහසු වීම
- කාලය ඉතිරි වීම
- සම්පත් නාස්තිය අවම වීම
- ඵලදායීතාව වැඩි වීම
- කාර්යක්ෂමතාව වැඩි වීම
- මානව හා සමාජ සම්බන්ධතා දුර්වල වීම

4.

- මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම
- මිනිසා අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම
- මිනිසුන් යාන්ත්‍රිකරණය වීම
- සමාජය සංකීර්ණ වීම
- පරිසර දූෂණය වේගවත් වීම
- මිනිසා විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වීම
- තාක්ෂණයට දැඩි ලෙස යොමුවීම නිසා සමාජ සම්බන්ධතා බිඳ වැටීම

.

5.රටක පවත්නා සමාජ,ආර්ථික,සංස්කෘතික,පාරිසරික රටාවලට ගැළපෙන පරිදි තාක්ෂණය යොදා ගැනීම

6.

- සම්පත් අපතේ යාම වැළකීම
- ශ්‍රම සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වීම
- පරිසර හානිය අවම වීම
- පාරිසරික තුලාතාව රැක ගත හැකි වීම
- රටේ ආර්ථිකයට දරාගත හැකි වීම

7.

- ශ්‍රම විභජනය හා විශේෂීකරණය ඇති වීම
- එකලස් කිරීමේ කර්මාන්ත බිහි වීම
- අධිතාක්‍ෂණික කර්මාන්ත බිහි වීම
- නිෂ්පාදන ක්‍රියාවලියට රොබෝ තාක්‍ෂණය යොදා ගැනීම
- විද්‍යුත් තාක්ෂණය හා නැනෝ තාක්ෂණය භාවිත කිරීම
- විවිධ ගවේෂණ හා පර්යේෂණ සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපාංග නිපදවීම (චන්ද්‍රිකා හා අභ්‍යවකාශ යානා)

8. e- Learning, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය

9.

- පුද්ගලයා අයහපත් පරිභෝජන රටාවකට හුරු වීම
- ආර්ථිකයට ඔරොත්තු නොදෙන ජීවන රටාවකට යොමු වීම
- වැරදි චර්යාවන්ට හුරු වීම
- නාගරීකරණය වීම
- පරිසරය දූෂණය වීම
- යාන්ත්‍රීකරණය වීම
- මානසික ආතති ඇති වීම
- නිශ්චය කරගත නොහැකි ලෙඩරෝග ඇති වීම

10.

කාර්මික අංශය

- විද්‍යුත් තාක්ෂණික ශිල්පීන්
- ඩ්‍රෝන කැමරා ශිල්පීන්
- රොබෝ තාක්ෂණික ශිල්පීන්
- නැනෝ තාක්ෂණික ශිල්පීන්
- පරිගණක තාක්ෂණ ශිල්පීන්
- මෘදුකාංග ශිල්පීන්

11.

- පරිගණක දත්ත සැකසුම් ශිල්පීන්
- මෘදුකාංග ශිල්පීන්
- උද්‍යාන සැකසුම් ශිල්පීන්
- ජාන තාක්ෂණ ශිල්පීන්
- මෝස්තර නිරූපණ ශිල්පීන්
- ග්‍රැෆික් නිර්මාණකරුවන්
- භාෂා පරිවර්තකයන්

- විසිතුරු මල් වවන්නන්
- ගෘහ නිර්මාණ ශිල්පීන්
- සුරතල් මසුන් ඇති කරන්නන්
- මාධ්‍ය ශිල්පීන්
- උත්සව සංවිධානකරුවන්
- දත්ත විශ්ලේෂකයන්
- උපදේශන ශිල්පීන්

.

12. යහපත්ව ජීවත් වීම යහජීවනයයි,නැතහොත් අන් අයට කරදරයක් නොවන අයුරින් නීත්‍යානුකූල මාර්ගවලින් ධනය උපයාගෙන ධාර්මිකව ජීවත් වීම යහජීවනයයි

13. සමාජ යහපැවැත්ම සඳහා , පුද්ගල අභිරුචිවල විවිධත්වය , ජීවන රටාව සංකීර්ණ වීම , ධාර්මිකව ධනය ඉපැයීම හා පරිහරණය

14.

| | |
|---|---|
| ▪ නීතිගරුක බව | ▪ උත්සාහවන්ත බව |
| ▪ හොඳින් සවන් දීම | ▪ සතුටින් සිටීම |
| ▪ පරිත්‍යාගශීලී බව | ▪ කඩිසර බව |
| ▪ කළගුණ සැලකීම | ▪ අවංක බව |
| ▪ ලද දෙයින් සතුටු වීම | ▪ ස්තුති කිරීම |
| ▪ සුහදශීලී බව | ▪ කරුණාව |
| ▪ ධාර්මික බව | ▪ ඉවසීම |
| ▪ සැහැල්ලු දිවි පැවැත්ම | ▪ පරිසරයට ආදරය කිරීම |
| ▪ ධෛර්යවන්ත බව | ▪ හෘදය සාක්ෂියට අනුව කටයුතු කිරීම |
| ▪ සමාජ විරෝධී ක්‍රියාවලින් ඈත් වීම | ▪ මද්‍යසාර, මත්ද්‍රව්‍ය භාවිතයෙන් හා විවිධ විෂමාචාර ක්‍රියාවලින් වැළකීම |

15.

''ඊර්ෂ්‍යාව, ආශාව, කෝපය, නරක වචන
කථා කිරීම ආදියෙන් ඉවත් වීම යහපත් ධර්මයයි.''

''යහපත් චරිතයකින් යුතු වීම, සත්‍ය කථා කිරීම,
බොරුවට, වංචාවට බිය වීම වැදගත් ය.
මේ නිසා ලජ්ජා බිය රැකගෙන ජීවත් වීම යහපති.''

15.

''අධ්‍යාපනය ලැබූ අයගේ යහගුණ පූර්ණ චන්ද්‍රයා මෙන් වැඩේ.
අධ්‍යාපනයෙන් අඩු අයගේ යහගුණ අමාවක මෙන් අඩු වී යයි.''

16.

| | |
|---|---|
| ▪ මිනිසාගේ ජීවිත කාලය අවාසනාවන්ත ලෙස ගෙවී යාම | ▪ සමාජ සුරක්ෂිත බව බිඳ වැටීම |
| ▪ අන්තර් පුද්ගල සම්බන්ධතා බිඳ වැටීමෙන් පුද්ගලයා හුදෙකලා වීම | ▪ සමාජ සාමය බිඳ වැටීම |
| ▪ ස්වාභාවික සම්පත් විනාශ වීම | ▪ සමාජ විරෝධී ක්‍රියා වැඩි වීම |
| ▪ වියදම් අධික වීම, ඉතිරි කිරීම් අඩුවීම | ▪ ආතතිය වැඩි වීම |
| ▪ නාස්තිය වැඩි වීම | ▪ අපචාර වැඩි වීම |
| ▪ යහපැවැත්ම බිඳ වැටීම | ▪ අල්ලසට හා දූෂණයට යොමු වීම |
| | ▪ බිය සැක සහිතව ජීවත් වීමට සිදු වීම |

17.එකට ජීවත් වෙමින් එකිනෙකාට උදවු කර ගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීම

18.

- විවිධත්වයෙන් යුතු සමාජයේ එකමුතුකම රැකගැනීමට
- සමාජ සුරක්ෂිත බව තහවුරු කිරීමට
- තම අවශ්‍යතා ඉටු කරගත නොහැකි අයට උපකාර කිරීමට
- අසමානතාවෙන් යුත් සමාජයේ සමානාත්මතාව වර්ධනය කිරීමට සහජීවනය වැදගත් වේ.

19.

- සහයෝගයෙන් කටයුතු කිරීම
- බෙදුහදු ගැනීම
- අන්‍යයන්ට ගරු කිරීම
- සුහද බව
- අන්‍යෝන්‍ය විශ්වාසය
- අවංක බව
- සුබවාදී වීම
- යුතුකම් ඉටු කිරීම

.

20.

- පුද්ගල සංවර්ධනය සිදු වීම
- සාමය ස්ථාපිත වීම
- අන්‍යෝන්‍ය සුහදතාව ගොඩනැගීම
- සමාජ සංවර්ධනය වේගවත් වීම
- සමාජ සුරක්ෂිතතාව තහවුරු වීම
- ගැටුම් අවම වීම

21.බ්‍රිතාන්‍ය ජාතික රොබට් ඕවන්

22.

ආර්ථික දියුණුව සඳහා මිනිසුන් අතර පවතින තරගය වෙනුවට සහයෝගය හා සාරධර්ම ඇතුළත් හොඳ සමාජ පරිසරයක් පදනම් කර ගත් සේවය සමුපකාරය නම් වේ.

**බ්‍රිතාන්‍ය ජාතික රොබට් ඕවන් - 1845**

23.

- සාමාජික අවශ්‍යතා පිරිමසාලීම
- මිනිසාට වඩා හොඳින් ජීවත් වීමට මාර්ගයක් ඇති කිරීම
- ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහාය වීම
- තනි තනිව ඉටු කරගත නොහැකි අවශ්‍යතා සාමූහික ශක්තියෙන් පහසුවෙන් ඉටු කරගැනීම

24.එකා සැමටත් සැම එකාටත්

25.

- පහසු මිලට පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි කිරීම
- ණය පහසුකම් සැපයීම
- විවිධ ගුහසාධන සේවා පවත්වාගෙන යාම
- සාමාජික ඉතුරුම් පවත්වාගෙන යාම
- දැනුම්වත් කිරීමේ විවිධ වැඩසටහන් කිරීම

- බැංකු සේවා සැපයීම
- ප්‍රවාහන සේවා සැපයීම
- කෘෂි නිෂ්පාදන මිල දී ගැනීම
- රක්ෂණ සේවා සැපයීම
- රෝහල් පවත්වාගෙන යාම
- අවමංගල්‍ය සේවා සැපයීම
- ඉන්ධන පිරවුම්හල් පවත්වාගෙන යාම

26.

- ජනතාවට සේවා සැපයීම සඳහා සමුපකාර ප්‍රාදේශික පවත්වාගෙන යාම
- ණය දෙන සමිති පවත්වාගෙන යාම
- අවමංගල්‍ය සේවා සැපයීමට දායක වීම
- ප්‍රවාහන හා ඉන්ධන සේවා සැපයීම
- ආරෝග්‍යශාලා සේවා පවත්වාගෙන යාම
- බැංකු සේවා
- ස්වයං සේවා අලෙවිසල්
- කිරිහල්/ආපන ශාලා
- අධ්‍යාපන සේවා
- රක්ෂණ සේවා
- ළදරු පාසල්
- උකස් කටයුතු

27.

- පාසල් ලිපිද්‍රව්‍ය පහසු මිලට ලබා ගැනීම
- ආහාර ද්‍රව්‍ය පහසු මිලට ලබා ගැනීම
- ක්‍රීඩා උපකරණ පහසු මිලට ලබා ගැනීම
- නායකත්ව පුහුණුව
- සාමූහික ජීවන රටාවකට හුරු වීම
- සෙසු අවශ්‍යතා සපුරා ලීම

28.දේශීය ඖෂධ-කොතල හිඹුටු, බඹර වැල්,වෙනිවැල්,පුස් වැල්

දේශීය ශාක -ඇටඹ ,වල්වදල්,මහරත් මල්,කැකුණ,බදුල්ල

දේශීය සතුන් - නීල කොබෙයියා,කළු වඳුරා,පතිරණ සාලයා

වලි කුකුළා ,අං කටුස්සා

29.එකිනෙකාට උදවු කරගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීම

30.එක්සත් ජාතීනගේ සංවිධානය, සාර්ක් සංවිධානය ,යුරෝපා හවුල,ආසියානු සංවිධානය